**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සම්භාහනකරු/ සම්භාහනකාරිනී තනතුර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සම්බන්ධව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 1 කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (ඛණ්ඩ 02) - සංශෝධන අංක 01**

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| උප ලේඛණ 01-A, 01-B, 01- C | ඇතුලත්ව නැත | උප ලේඛණ 01-A, 01-B, 01- C හි ඇතුලත්ව ඇත. | මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු සම්භාහනකරු තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විෂයය නිර්දේශ ඇතුලත් කර නොමැතිවීම මත |

මධ්‍යම පළාත් සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..............................
02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික ..............................
03. ජේ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................
04. එන්.ඩී.කේ. පියුම්සිරි මහතා (සාමාජික) ..............................
05. ජේ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................
06. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

දිනය 2020/07/15

ආණ්ඩුකාර ලේකම්,

2020/07/15 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2020/675 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සම්භාහනකරු තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විෂයය නිර්දේශ ඇතුලත් කිරීමට" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2020.07.23

..............................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / නොකරමි.

2020/08/01

ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත

උප ලේඛණය 01- A

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

01. විභාගයේ නම :- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (ඛණ්ඩ 02) - සම්භාහනකරු/ සම්භාහනකාරිනී තනතුර සඳහා

02. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල ක්‍රම | පැය 01 | 100 | 40% |
| මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| ආයුර්වේද සම්භාහනය පිළිබඳ මූලික දැනුම පරික්ෂා කිරීම | පැය 01 | 100 | 40% |

03. විභාගය පවත්වන බලධාරියා :- මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල ක්‍රම | රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාවද රාජකාරී ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහනක් මඟින් තම අදහස්/ නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝ අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. |
| මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැන බැලීම අපේක්ෂා කෙරේ. |
| ආයුර්වේද සම්භාහනය පිළිබඳ මූලික දැනුම පරික්ෂා කිරීම | සම්භාහන ක්‍රමවල වැදගත්කම, අරමුණු සහ පරමාර්ථ නව්‍ය සහ ආයුර්වේද මත අනුව පැහැදිලි කිරීම, සම්භාහනය සඳහා අවශ්‍ය වන ඖෂධ වර්ග හා ඊට අදාළ ඖෂධ නිෂ්පාදනය හා සම්භාහනය මූලධර්ම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර බැලේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2020/08/01 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

උප ලේඛණය 01- B

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

01. විභාගයේ නම :- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (ඛණ්ඩ 02) - සම්භාහනකරු/ සම්භාහනකාරිනී තනතුර සඳහා

02. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයුර්වේද ක්ෂේත්‍රය | පැය 01 | 100 | 40% |
| සම්භාහන/අභ්‍යංග ක්‍රමවේදය | පැය 01 | 100 | 40% |

03. විභාගය පවත්වන බලධාරියා :- මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයුර්වේද ක්ෂේත්‍රය | ආයුර්වේද රෝහල් තුල ක්‍රියාත්මක වන චිකිත්සා ක්‍රම වලදී යොදා ගන්නා ආයුර්වේද මූලධර්ම හා පත්‍ය අපත්‍ය ආහාර විහරණ ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| සම්භාහන/අභ්‍යංග ක්‍රමවේදය | සම්භාහන ක්‍රමවේදය හඳුනා ගැනීම, සම්භාහන ක්‍රමවේද යොදා ගන්නා අවස්ථා හා විවිධ රෝග සඳහා සම්භාහන ප්‍රතිකර්ම පිළිබඳ මූලික දැනුම පරීක්ෂාව |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2020/08/01 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

උප ලේඛණය 01- C

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

01\. විභාගයේ නම :- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය III කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (ඛණ්ඩ 02) - සම්භාහනකරු/ සම්භාහනකාරිනී තනතුර සඳහා

02\. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයුර්වේද ක්ෂේත්‍රය | පැය 01 | 100 | 40% |
| සම්භාහන ප්‍රායෝගික දැනීම | පැය 01 | 100 | 40% |
| පොදු ප්‍රශ්ණ පත්‍රය (සම්භාහනය) | පැය 01 | 100 | 40% |

03\. විභාගය පවත්වන බලධාරියා :- මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක්

04\. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

05\. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයුර්වේද ක්ෂේත්‍රය | ආයුර්වේද සම්භාහන ක්‍රම හා වාට්ටුව තුළ ක්‍රියාත්මක වන චිකිත්සා ක්‍රම වලදී යොදා ගන්නා මූලධර්ම පිළිබඳ අදාළ නිලධාරියාගේ දැනුම හා කුසලතාවයන් ඔහුගේ ජ්‍යෙෂ්ඨතාවයට සරිලන පරිදි වැඩිදියුණු වී තිබේද යන්න හා ගත වූ කාලය තුළ එකී ක්ෂේත්‍රයන්හි සිදු වී ඇති නව්‍යකරණයන් පිළිබඳව දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීමේ ව්‍යුහගත ප්‍රශ්ණ පත්‍රයකට පිළිතුරු සැපයීම |
| සම්භාහන ප්‍රායෝගික දැනීම | සම්භාහනය සම්බන්ධ ගැටළුවකට ගත යුතු ක්‍රියා මාර්ග ඇතුළත් වන පරිදි ව්‍යුහගත ප්‍රශ්ණ පත්‍රයකට පිළිතුරු සැපයීම |
| පොදු ප්‍රශ්ණ පත්‍රය (සම්භාහනය) | පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්හි විෂය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ අදාළ නිලධාරියගේ දැනුම හා කුසලතාවයන් ඔහුගේ ජ්‍යෙෂ්ඨතාවයට සරිලන පරිදි වැඩිදියුණු වී තිබේද යන්න මැන බැලීමේ බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකට පිළිතුරු සැපයීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2020/08/01 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්